# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1738/15 - 2011 දෙසැම්බර් 29 වැනි බ්‍රහස්පතින්දා - 2011.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2004 අංක 11 දරන මුදල් පනත**

22 සහ 26 වැනි වගන්ති යටතේ නියෝග

2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මෙම ගැසට් නිවේදනය මගින් 2010 අංක 01 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීමේ) නියෝග 2012.01.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත දක්වා ඇති ආකාරයට සංශෝධනය කරනු ලබන බව ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2011 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

(1) 2010 ජූලි මස 12 වැනි දිනැති අංක 1662/1 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීමේ) නියෝගය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(අ) I වැනි උපලේඛනයෙහි 'අ', 'ආ', සහ 'ඇ', යන වගු පරිච්ඡින්න කර ඒ වෙනුවට පහත සඳහන් I වැනි උපලේඛනයෙහි 'අ', 'ආ', සහ 'ඇ', යන වගු ආදේශ කිරීමෙන්.

***I* වැනි උපලේඛනය**

*'අ' වගුව*

(4 වැනි නියෝගය)

එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව (මිනිත්තුවකට ඇ.ඩො.ශත)* |
|---|---|---|
| 2011 | 2011.01.01 - 2011.12.31 | 7.00 |
| 2012 | 2012.01.01 - 2012.12.31 | 9.00 |
| 2013 | 2013.01.01 - 2013.12.31 | 9.00 |

1A - G 15514 — 935 (2011/12)

*'ආ' වගුව*

(5 වැනි නියෝගය)

එන දේශීය ප්‍රවේශ ගාස්තු (එ.දේ.ප්‍ර.ගා.) වශයෙන් වූ බදු බෙදාහැරීමේ අනුප්‍රමාණය

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව (මිනිත්තුවකට ඇ.ඩො.ශත)* |
|---|---|---|
| 2011 | 2011.01.01 - 2011.12.31 | 5.50 |
| 2012 | 2012.01.01 - 2012.12.31 | 6.00 |
| 2013 | 2013.01.01 - 2013.12.31 | 6.00 |

*'ඇ' වගුව*

(5, 7 සහ 8 වැනි නියෝග)

විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව (වි.සං.ස.ගා.) වශයෙන් වූ බදු බෙදහැරීමේ අනුප්‍රමාණය

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව (මිනිත්තුවකට ඇ.ඩො.ශත)* |
|---|---|---|
| 2011 | 2011.01.01 - 2011.12.31 | 1.50 |
| 2012 | 2012.01.01 - 2012.12.31 | 3.00 |
| 2013 | 2013.01.01 - 2013.12.31 | 3.00 |

(2) 2010 නොවැම්බර් මස 19 වැනි දිනැති අංක 1680/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2010 අංක 1 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීමේ) නියෝග සඳහා සිදු කරන ලද සංශෝධන, පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(අ) I වැනි උපලේඛනයෙහි 'අ (i)' සහ 'ඇ', යන වගු පරිච්ඡින්න කර ඒ වෙනුවට පහත දැක්වෙන I වැනි උපලේඛනයෙහි 'අ (i)', සහ 'ඇ', යන වගු ආදේශ කිරීමෙන්.

***I වැනි උපලේඛනය***

*'අ (i)' වගුව*

(4 (අ), 7 සහ 8 වැනි නියෝග)

විශේෂිත දුරකථන අංක (වි.දු.අ.) සඳහා එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *එක් දුරකථන අංකයක් සඳහා මසකට අය කිරීම (ඇ.ඩො.)* | *මසකට මිනිත්තු 1500 ඉක්මවූ විට අයකිරීම (ඇ. ඩො. ශත)* |
|---|---|---|---|
| 2011 | 2011.01.01 - 2011.12.31 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 1.50 |
| 2012 | 2012.01.01 - 2012.12.31 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 3.00 |
| 2013 | 2013.01.01 - 2013.12.31 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 3.00 |

'ඇ' වගුව

(9 සහ 9 (අ) වැනි නියෝග)

යන දේශීය ප්‍රවේශ ගාස්තු (ය. දේ. ප්‍ර. ගා.) මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *එක් මිනිත්තුවක් සඳහා අය කිරීම (ශ්‍රී ලංකා රුපියල්)* |
|---|---|---|
| 2011 | 2011.01.01 - 2011.12.31 | 2.00 |
| 2012 | 2012.01.01 - 2012.12.31 | 3.00 |
| 2013 | 2013.01.01 - 2013.12.31 | 3.00 |

01 - 452

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.